## හැඳින්වීම

කථිකත්වය සම්බන්ධයෙන් පොතක් ලිවීම මා බොහෝ කාලයක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටි සිහිනයක් සැබෑ වීමකි. මා දශක ගණනාවක් තිස්සේ කථිකත්ව කලාව පිළිබඳව කළ හැදෑරීම් සහ ප්‍රායෝගිකව කථිකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබා ඇති අත්දැකීම් මෙම කෘතිය රචනා කිරීම සඳහා පූර්ණ සුදුසුකමක් ලෙස මම තදබල ලෙස විශ්වාස කරමි. මම මේ වන විට බොහෝ කථිකයන්ට ඇහුම්කන් දී ඇත්තෙමි. එසේම බොහෝ වාර ගණනාවක් එකිනෙකට වෙනස් විවිධ අවස්ථාවල කථා පවත්වා ඇත්තෙමි.

කථිකත්වය යනු සැබවින්ම කලාවකි. එනම් කථිකත්ව කලාවට අදාළ සාහිත්‍යයක්ද ඇත. සහජයෙන් කථික හැකියාව ඇති අයගේ සාමාන්‍ය ඉරියව් වලින් පවා ඔහු හෝ ඇය කථිකයෙකු බව නිගමනය කළ හැකිය. උදාහරණ ලෙස දක්ෂ කථිකයෙකු ඇවිදිද් දී කිසිඳු විධිමත් භාවයකින් තොරව දෑත් අසාමාන්‍ය ලෙස චලනය වන බව මම එක්තරා කෘතියක තිබෙනු දුටුවෙමි. මා ඒ පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී පෙනී ගියේ එහි කිසියම් සත්‍යතාවයක් ඇති බවය.

මෙම පොත ලිවීමේදී පාඨක ඔබට සහයෝගයක් ලෙස කථිකත්වය සම්බන්ධ මගේ පෞද්ගලික අත්දැකිම්ද, මගේ පියා වන විශ්‍රාම ලත් විදුහල්පති පී. ටී. සුගතදාස මහතා විසින් කරන ලද සමහර කතා වල කොටස් ද වරින් වර ඇතුළත් කර ඇත. මගේ මව වන අශෝකා සුගතදාස මහත්මිය විසින් කතා පැවැත්වීම පිළිබඳව මට දුන් උපදෙස් ද ඇතුළත් කර ඇත.

මහා වෘක්ෂයක් ලෙසින් මා අසල සිටිමින් මේ සියලු කටයුතු කිරීමට මා හට දිරිය දෙන දයාබර බිරිඳ කෙනෙත්සි රජිතා ද මේ මොහොතේ සිහිපත් කරමි. මෙවැනි කටයුතු වල දී මාව නිරන්තරයෙන් දිරිමත් කරන අයියා, මල්ලී, අක්කා ඇතුළු සියලු ඥාතීන්ව ද කෘතවේදීව සිහිපත් කරමි. කතා කරන සෑම වාරයකදීම පාහේ පොත ගැන විස්තර අසමින් මාව ධෛර්යමත් කළ ඇහැළියගොඩ මල්ලීව ද සිහිපත් කරමි. සංජීව, ගයාන්,

අශෝක, අනුර අයියා, පුබුදු කාරියවසම්, තිස්ස මහතා ඇතුළු සියලු මිතුරන්ගෙන් මා හට ලැබෙන ධෛර්යය ද කිසිදා අමතක නොවේ.

"කථිකත්වයේ අසිරිය" නම් වූ මෙම කෘතිය පාඨක ඔබ වෙතට ගෙන ඒමේ සම්භාවනීය අවස්ථාව මා හට ලබා දුන් දේශබන්ධු සිරිසුමන ගොඩගේ මැතිඳුන්ට ද මම සහස් වාරයක් ස්තුතිවන්ත වෙමි. එතුමා නොවන්නට සමහර විට මෙම කෘතිය මුද්‍රණය වීමට බොහෝ කල් ගත වන්නට පවා ඉඩ තිබුණි. තවත් මෙවැනි සමාජ සේවා කටයුතු වල නිරත වන්නට එතුමාට නිදුක් නිරෝගී චිර ජීවනය ලැබේවායි! ඉත සිතින් ප්‍රාර්ථනා කරමි. මෙම කෘතිය සඳහා කර්තෘ පිලිබඳව හැඳින්වීමක් සිදුකල ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දර්ශන අශෝක කුමාර මහතාටද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. අතරමැදි කටයුතු වලදී සහයෝගය දැක්වූ ගොඩගේ සමාගමේ පද්මිණී මහත්මිය ඇතුලු කාර්ය මණ්ඩලයට ද, පරිගණක අක්ෂර සංයෝජනය සිදුකල රූමායා ග්‍රැෆික්ස් ආයතනයට ද, මුද්‍රණ කටයුතු සිදුකල චතුර මුද්‍රණාලයෙහි කාර්ය මණ්ඩලයට ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

පාරින්ද්‍ර සුගතදාස
071 4410906

## කථිකත්වයේ අසිරිය

- කථිකත්ව හැකියාවක් තිබීමේ වැදගත්කම
- තම හැකියාව පිළිබඳව ඇති ස්වයං තක්සේරුවේ වටිනාකම
- කථිකයෙකු ලෙස මගේ අදහස්
- අවස්ථාව වාසනාව බවට පත් කර ගන්නා හැටි
- කථාව දීර්ඝ නොකිරීම සැම විටම වාසිදායකය
- පැළැටිය මහා වෘක්ෂයක් වන තුරු වැඩෙන්නට ඉඩ හරින්න
- අසන්නන්ව තේරුම් ගැනීමේ ඇති වැදගත්කම
- ඇත්ත කථා කිරීම හැම විටම ඥානාන්විතය
- නිර්ලෝභී ප්‍රකාශවලින් කථාවේ අගය වැඩි වේ
- දක්ෂ කථිකයෙකු වීම සඳහා මුල පිරීම
- කථිකත්වය සහජ හැකියාවක්ද?
- කථිකත්වය වර්ධනය කර ගැනීමේ උපක්‍රම
- විද්වතුන්ගේ අදහස් කථාවට සම්බන්ධ කර ගන්න
- ප්‍රසිද්ධ කථිකයන්ගේ විශේෂ කතා මතක තබා ගන්න
- කුතුහලය දනවන පරිදි උපුටා ගැනීම් භාවිත කරන්න
- ලෝක ප්‍රසිද්ධ කථාවක්
- ප්‍රේක්ෂක අවධානය දිනා ගැනීමේ උපක්‍රම
- අසන්නන් මවිතයට පත් වන යමක් පවසන්න
- අසන්නන්ගේ අවධානය දිනා ගත හැකි උපක්‍රම තව දුරටත්
- සැම විටම කථාවක් බලපොරොත්තුවෙන් සිටින්න
- කථාවේ පූජනීය වටිනාකම රැක ගන්න
- කථා නොපැවැත්විය යුතු ස්ථාන කල් ඇතුව හඳුනා ගන්න
- යහපත් චරිතයක් පවත්වා ගෙන යන්න
- අංග චලනය යනු අත සෙලවීම පමණක්මද?
- කථිකයාගේ උද්යෝගය වැඩි කර ගැනීමේ උපක්‍රම
- බිය, සැක නැති පරිසරයක අවශ්‍යතාවය
- හඬ පාලනයෙහි ඇති වැදගත්කම
- බලා ගෙන කරන කථා